**ශීර්ෂය 157- ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 157 - ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 20 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 592.37 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 405.91 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 186.45 ක් හෙවත් සියයට 31.48 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 287.07 | 260.68 | 26.39 | 9.19 |
| මූලධන | 305.30 | 145.23 | 160.07 | 52.43 |
| **එකතුව** | **592.37** | **405.91** | **186.46** | **31.48** |

## 2.2 අත්තිකාරම් ගිණුම

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 15701 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 3.00 | 0.49 | 0.50 | 1.41 | 60.00 | 23.91 |

## 2.3 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0362/0015/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය රු.මිලියන 15.85 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.38,698 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0154/000 | 20,000 |
| 6000/0000/00/0013/0107/000 | 11,648 |
| 6000/0000/00/0018/0101/000 | 7,050 |
| **එකතුව** | **38,698** |

## 2.5 විගණන නිරීක්ෂණය

ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 10 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.39,090,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) වැය විෂයයන් 44 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

### 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.235,320 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 2 ක සිට වර්ෂ 5 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණි.

### 3.3 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ " නීතිය බලාත්මක කිරීම, යුක්ති දාමයට සම ප්‍රවේශ වීම හා ශ්‍රී ලංකාවේ සමාජ ඒකාබද්ධතාවය ශක්තිමත් කිරීම පිළිබඳ ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.47,197,492 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 41,790,125 ක ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) විදේශාධාර ව්‍යාපෘතියේ කාර්යසාධනය**

සමාජ ඒකාබද්ධතාවය සඳහා වෙනසක් කළ හැකි නියෝජිතයන් පිරිසක් ලෙස ගුරුවරුන් බලගැන්වීමේ වැඩසටහන සඳහා රු.2,691,920 ක ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු.662,298 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබුණි.

**(ආ) විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කාර්යයන් අතහැර දැමීම**

සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා ටෙලිනාට්‍යයක් නිර්මාණය කිරීම සඳහා රු.7,500,000 ක ප්‍රතිපාදන 2013 වර්ෂයේ සිට සලසා තිබුණත්, ඉන් රු.500,000 ක් පමණක් පිටපත් රචනය සඳහා වැයකර තිබුණි. නියමිත කාල සීමාව තුළ කාර්යය ඉටු නොකිරීම මත ඉතිරි ප්‍රතිපාදන ආපසු යැවීමට සිදුවී තිබුණි.

### 3.4 කාර්යසාධනය

2015 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයේදී පොලිස් නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩ සටහන් 10 ක් පැවැත්වීමට රු.3,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, ඉන් රු.835,460 ක් වැයකර වැඩ සටහන් 4 ක් පමණක් පවත්වා තිබුණි.

### 3.5 අවිධිමත් ගනුදෙනු

2015 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලද සුහාරතී වැඩසටහන සිංහල හා දෙමළ භාෂාවලින් සම්පාදනය කිරීම හා ප්‍රවෘත්ති පූර්ව නිවේදන සැකසීම වෙනුවෙන් රු.240,000 ක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 මාර්ගෝපදේශය අනුගමනය කිරීමකින් තොරව, තෝරා ගත් ප්‍රචාරණ නියෝජිතයෙකු වෙත ගෙවා තිබුණි. එම ආයතනය ගුවන්විදුලි වැඩසටහන් සම්බන්ධීකරණය සම්බන්ධයෙන් ලබා ඇති පලපුරුද්ද පිළිබඳ තහවුරු කර ගැනීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

### 3.6 අනාර්ථික ගනුදෙනු

නියැදි විගණනන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී භාෂා සැලැසුම් පිළියෙල කිරීමේ මාර්ගෝපදේශ අත්පොත් 2,500 ක් භාෂා ව්‍යාපෘතියේ ප්‍රතිපාදනවලින් මුද්‍රණය කර දි තිබුණි. ඉන් පොත් 1304 ක් ඉතිරිව තිබියෙදී නැවතත් රු.1,263,180 ක් වැයකර තවත් පිටපත් 2,000 ක් මුද්‍රණය කර තිබුණි. එම පොත් සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේ ගබඩාවට ලැබී තිබුණි. 2015 දෙසැම්බර් 31 දින වන විට පොත් 1030 ක් ඉතිරි වී තිබුණි.

(ආ) බණ්ඩාරවෙල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ද්විභාෂා සහන කවුළුව ඉදිකිරීම සඳහා 2011 වර්ෂයේදී රු.125,587 ක් වැයකර තිබුණත්, 2015 වර්ෂයේදී නැවතත් රු.199,920 ක් ද්විභාෂා සහන කවුළු ඉදිකිරීම සඳහා වැයකර තිබුණි.

### 3.7 කළමනාකරණ දුර්වලතා

2012 දෙසැම්බර් 01 දින සිට වසරක කාලයකට විදේශ ගතවීම සඳහා වැටුප් රහිත නිවාඩු ලබා සිටි, ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාරවරියක 2013 දෙසැම්බර් 02 දින සිට සේවයට වාර්තා කර නොතිබුණි. ඒ අනුව විදේශ නිවාඩු අයදුම් කිරීමේදී අත්සන් කරන ලද ගිවිසුම් පත්‍රය ප්‍රකාරව රජයට ගෙවිය යුතු රු.97,400 ක මුදල 2015 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි

**3.8** **මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 24 | 14 | 10 |
| (ii) | තෘතියික මට්ටම | 04 | 03 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 432 | 268 | 164 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 111 | 96 | 15 |
| | එකතුව | 571 | 381 | 190 |